SRI LANKA
IMMIGRATION AND EMIGRATION

දිනය: 2021-09-03
අංකය: 17

# <u>මාධ්‍ය නිවේදනයයි</u>
# <u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව</u>

දැනට ශ්‍රී ලංකාව තුල රැඳී සිටින විදේශිකයන් ලබා ගෙන ඇති **සියලු වර්ගයේ** වලංගු **වීසාවන්හි** කාලය **2021 සැප්තැම්බර් 07** වන දින සිට **2021 ඔක්තෝබර් 07** වන දින දක්වා දින **30** කින් දීර්ඝ කරන ලදී. ඒ අනුව **2021 මැයි 11** වන දින සිට **2021 ඔක්තෝබර් 07** වන දින දක්වා කාල සීමාව තුළ කල් ඉකුත් වූ වලංගු වීසා සඳහා එම කාල සීමාවට අදාළ වීසා ගාස්තු පමණක් අය කරනු ලබන අතර කිසිදු දඩ මුදලක් අය කරනු නො ලැබේ.

**<u>• සංචාරක වීසා දරන්නන් හට වීසා පිටසන් කර ගැනීමට උපදෙස්;</u>**

ඒ අනුව සංචාරක වීසා දරන්නන් එම වීසා දීර්ඝ කිරීමට අදාළව වීසා ගාස්තු ගෙවීම හා වීසාව පිටසන් කර ගැනීමට පහත ක්‍රමවේදයන් අතරින් එක් ක්‍රමවේදයක් භාවිතා කළ හැක;

1. https://eservices.immigration.gov.lk/vs දරන වෙබ් අඩවියට පිවිස අදාළ ගාස්තු ගෙවා මාර්ගස්ථ ක්‍රමවේදය ඔස්සේ වීසා ලබා ගැනීම හෝ (ශ්‍රී ලංකාවට පැමිණි දින සිට උපරිම මාස 9ක් දක්වා);

2. **2021 ඔක්තෝබර් 07** වන දිනට පෙර දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් අදාළ වීසා ගාස්තු ගුවන් තොටුපල වෙත ගෙවා දිවයිනෙන් බැහැර වීම හෝ;

3. **2021 ඔක්තෝබර් 07** වන දින පෙර, සංචරණ සීමාවන්ට යටත්ව බත්තරමුල්ල කාර්යාල වෙත පැමිණ අදාළ ගාස්තු ගෙවා වීසාව ගමන් බලපත්‍රයේ පිටසන් කර ගැනීම.

**<u>• නේවාසික වීසා දරන්නන් හට උපදෙස්;</u>**

**2021** සැප්තැම්බර් **07** වන දින සිට **2021** ඔක්තෝබර් **07** වන දින දක්වා වන වීසා දීර්ඝ කිරීම සියලු වලංගු නේවාසික වීසා දරන්නන් හටද අදාළ වන අතර එදිනට පෙර වීසාව දීර්ඝ කර ගැනීමට රාජකාරි දිනවල පෙ.ව. 8:30 සිට ප.ව. 3:00 දක්වා 0707101050 දරන දුරකථන අංකය අමතා දිනයක් හා වේලාවක් වෙන් කොට ගෙන **2021 ඔක්තෝබර් 07** වන දිනට පෙර බත්තරමුල්ල කාර්යාලයට පැමිණ අදාළ ගාස්තු ගෙවා වීසා පිටසන ලබා ගත යුතු ය.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව